**ශීර්ෂය - 06 රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 06 - රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 අගෝස්තු 16 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැඳීම් වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2024 වර්ෂයේ ජනවාරි හා පෙබරවාරි මාසවල ගෙවීම් කර තිබුණු එකතුව රු.1,457,443 ක් වූ 2023 වර්ෂයට අදාල වැය විෂයයන් 03 ක බැරකම් මු.රෙ.94 (2) සහ (3) ප්‍රකාරව බැරකම්වලට එළඹෙන ලද බැඳීම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි.ඉන් එක්වැය විෂයයක ප්‍රතිපාදන ඉතිරිය ඉක්මවීම රු.58,280 ක් වී තිබුණි. | දක්වා ඇති බිල්පත් දෙසැම්බර් මසට අදාල බිල්පත් වන අතර ඒවා ගෙවීම් කිරීම සඳහා වවුචර් පත් ලැබී ඇත්තේ ජනවාරි මාසයේදී ය. බැරකම් ප්‍රකාශය සකස් කිරීමේදී මෙම බිල්පත් ගෙවීම් කිරීමට ලැබී නොමැති බැවින් බැරකම් ප්‍රකාශයට ඇතුලත් වී නොමැත. | සමාලෝචිත වර්ෂයට අදාල සියළු බැරකම් බැරකම්වලට එළඹෙන ලද බැඳීම් ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු වීම |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතීන්හි 237 වන වගන්තිය ප්‍රකාරව, | අභියාචනා අංශය වෙත ලැබෙන බොහොමයක් අභියාචනා, නිලධාරීන් විසින් ප්‍රමාදය වැලැක්වීම සඳහා ප්‍රගමන පිටපතක් වශයෙන් යොමු කරන අභියාචනා වන අතර, එකී අභියාචනා සම්බන්ධයෙන් අදාල අමාත්‍යාංශ වෙතින් | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතීන්හි 237 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | කොමිෂන් සභාව වෙත යොමුකළ අභියාචනයක් කොමිෂන් සභාව වෙත ලැබී, ස්ථාන මාරු සම්බන්ධයෙන් දින 15 ක් හා උසස් කිරීම් සම්බන්ධයෙන් දින 45 ක් ඇතුළත තීරණයක් කොමිෂන් සභාව විසින් ගනු ලැබිය යුතු වේ. එසේ වුවද නියැදි පරීක්ෂාවට ලක් කරන ලද 2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලයේදී ලැබුණු ඉල්ලීම් වලට අදාල අභියාචනා ලිපිගොනු 10 කින් ලිපිගොනු 04 කට අදාල තීරණ 2024.01.22 දින වන විටත් ලබාදී නොතිබුණු අතර තීරණ ලබාදී තිබූ ලිපිගොනු 06 ක් සඳහා තීරණ ලබාදීමට අවුරුදු 01 සිට අවුරුදු 07 ක කාලයක් ගත කර තිබුණි. | නිරීක්ෂණ නිර්දේශ ඇතුලත් වාර්තා හා ලිපිගොනු කැඳවූවද එකී වර්ෂය තුලම එම වාර්තා නොලැබීමේ හේතුව මත අභියාචනා ලද වර්ෂය තුලම කොමිෂන් සභා තීරණය ලබා දීමට නොහැකි වී ඇත. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුල ලැබෙන අභියාචනා ප්‍රමාණය සහ එම අභියාචනා සඳහා වර්ෂය තුලම තීරණ ලබාදී කටයුතු අවසන් කළ අභියාචනා ප්‍රමාණය මත පමණක් කාර්ය සාධනය මැන බලන්නේ නම්, අදාල වාර්තා ලබා දෙන අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු එකී වාර්තා ඉදිරිපත් කිරීමට ගතවන කාලය මත තීරණය වනු ඇති බව නිරීක්ෂණය කරමි. | |
| (ආ) | 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති අවලංගු කර නිකුත් කර තිබූ 2022 පෙබරවාරි 14 දිනැති හා අංක 2310/29 දරන කාර්ය පටිපාටික රීතීන්වල උසස් කිරීම් සම්බන්ධයෙන් ලැබෙන අභියාචනා සඳහා තීරණ ලබා දීමේ කාලසීමාව දක්වා නොතිබුණි. | කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන අභියාචනා සංඛ්‍යාව අනුව එක් අභියාචනයක් සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට ගත වන කාලය පදනම්ව ඒ සඳහා කාල සීමාවක් පැනවීම ප්‍රායෝගික නොවේ. කෙසේ වෙතත්, අභියාචනයක් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී හේතුවක් රහිතව ප්‍රමාදයන් සිදුවීම වැලැක්වීම සඳහා අභ්‍යන්තර ස්ථාවර නියෝග පනවා ඇත. | අංක 1589/30 දරන කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවල සඳහන් පරිදි උසස් කිරීම් සම්බන්ධයෙන් ලැබෙන අභියාචනා සඳහා තීරණ ලබා දීමේ කාලසීමාව සඳහන් කළ යුතු වීම. |
| (ඇ) | කොමිෂන් සභාවේ විනය පාලනයට යටත් නිලධාරීන්ගේ විනය සම්බන්ධයෙන් කටයුතු කිරීම කොමිෂන් සභාවේ එක් ප්‍රධාන කාර්යයක් වන අතර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLXIII පරිච්ඡේදය සම්බන්ධයෙන් | කෙටුම්පත් වාර්තාව සඳහා පිළිතුරු ලබාදී නොමැත. | අංක 30/2019 දරන හා 2019 සැප්තැම්බර් 30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

නිකුත් කර ඇති 30/2019 දරන හා 2019 සැප්තැම්බර් 30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව වියිමත් විනය පරීක්ෂණයක් ආරම්භ කර මාස 06 ක් ඇතුළත එය නිම කළ යුතු බව සඳහන් වුවද නියැදි විගණන පරීක්ෂණයට ලක් කළ විනය කටයුතු 08 ක එම ඉල්ලීම් ලැබී වසර 02 සිට වසර 04 දක්වා කාලයක් ගත වී තිබුණද 2024 පෙබරවාරි 24 දින වන විටත් එම විනය කටයුතු අවසන්ව නොතිබුණි.

### 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කල යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව, ආයතන අංශය, විනය අංශය, පත්කිරීම් අංශය හා උසස් කිරීම් අංශය විසින් 2023 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන් සංඛ්‍යාව පමණක් කාර්යසාධන වාර්තාවේ ඇතුළත් කර තිබු අතර සමාලෝචිත වර්ෂය තුල අංශයට ලැබුණු පැමිණිලි සංඛ්‍යාව, එම පැමිණිලි තුලින් නිම කළ ප්‍රමාණය සහ තවදුරටත් ඉතිරිව පවතින ප්‍රමාණය යන තොරතුරු ඇතුළත් කර නොතිබුණි. ඒ අනුව 2023 කාර්යසාධන වාර්තාව තුල 2023 වර්ෂයේ කාර්ය සාධන මට්ටම සලකා බැලීමට තරම් ප්‍රමාණවත් කරුණු ඇතුළත් කර නොතිබුණි | රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු වන ලිපි හා ලේඛන සඳහා කටයුතු කිරීමේදී බාහිර ආයතන මගින් නිරීක්ෂණ හා නිර්දේශ කැඳවන අතර ඒ සඳහා පිළිතුරු යොමු වන කාලය අනුව එම කරුණු නිමා කරන වර්ෂය ඉල්ලීම/ පැමිණිල්ල ලද වර්ෂයම නොවීමට අවකාශයක් ඇති අතර ඉන් පසු එළඹෙන වර්ෂ තුළදී නිම කිරීමට සිදු විය හැක. එබැවින් වෙනත් පාර්ශවයක ප්‍රමාදයන් හේතුවෙන් එම කාර්යයන් නිම කිරීමට ගත වන කාලය මෙම කාර්යාලයේ සමාලෝචිත වර්ෂයේ කාර්යය සාධනය තීරණයට අදාල කර ගැනීම සාධනීය නොවන බවද නිරීක්ෂණය කරමි. | කාර්යසාධන වාර්තාව තුල වර්ෂයේ කාර්ය සාධන මට්ටම සලකා බැලීමට තරම් ප්‍රමාණවත් කරුණු ඇතුළත් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2023 වර්ෂයේ අභියාචන අංශයට ලැබුණු අභියාචනා ප්‍රමාණය ප්‍රමාණාත්මකව දක්වා තිබුණද, නිරීක්ෂණ හා නිර්දේශ සහිත වාර්තා කැඳවූ අභියාචනා ගණන සහ කටයුතු නිම කළ අභියාචනා ප්‍රමාණය ඉදිරිපත් කිරීමේදී එය සමාලෝචිත වර්ෂයේ සහ පෙර වර්ෂයන්හි අභියාචනා ප්‍රමාණයද ඇතුළත්ව ඉදිරිපත් කර තිබුණු අතර එහි කාල විශ්ලේශනයක් ඉදිරිපත් කර නොතිබුණි. එම හේතුවෙන් එම අංශයේ සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන මට්ටම නිශ්චය කිරීමට ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | අභියාචනා අංශය වෙත ලැබෙන අභියාචනා සම්බන්ධයෙන් අදාල අමාත්‍යාංශ වෙතින් නිරීක්ෂණ නිර්දේශ ඇතුලත් වාර්තා හා ලිපිගොනු ගෙන්වා ගැනීම සඳහා අභියාචනා අංශය මඟින් කඩිනමින් කටයුතු කරනු ලැබේ. අදාල අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් වාර්තා කැඳවූව ද එකී වර්ෂය තුලම එම වාර්තා නොලැබෙන අතර එම හේතුව මත අභියාචනා ලද වර්ෂය තුලම කොමිෂන් සභා තීරණය ලබා දීමට නොහැකි වී ඇත. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුල ලැබෙන අභියාචනා ප්‍රමාණය සහ එම අභියාචනා සඳහා එම වර්ෂය තුලම තීරණ ලබා දී කටයුතු අවසන් කළ අභියාචනා ප්‍රමාණය මත පමණක් කාර්ය සාධනය මැන බලන්නේ නම්, එම කාර්ය සාධනය අදාල වාර්තා ලබා දෙන අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු එකී වාර්තා ඉදිරිපත් කිරීමට ගතවන කාලය මත තීරණය වනු ඇති බව නිරීක්ෂණය කරමි. | කාර්යසාධන වාර්තාව තුල වර්ෂයේ කාර්ය සාධන මට්ටම සලකා බැලීමට තරම් ප්‍රමාණවත් කරුණු ඇතුළත් කළ යුතු වීම. |
| (ඇ) | 2023 ක්‍රියාකාරී සැලැස්මේ ඉටු කිරීමට අපේක්ෂිත එක් එක් කාර්යයන්වල ඉලක්ක හෝ ලැබී තිබූ කාර්යයන් ප්‍රමාණය සඳහන් කර නොතිබියදී කාර්යසාධන දර්ශක යටතේ අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස තත්‍ය නිමැවුම සියයට 100 ත් සියයට 90 ත් අතර ප්‍රතිශතයක් දක්වා තිබීම ගැටලුකාරී විය. | මෙම කාර්යාලය වෙත ලැබෙන ඉල්ලීම් සංඛ්‍යාව නිශ්චිතව පුරෝකථනය කිරීමේ හැකියාවක් නොමැති බැවින්ද, පෙර වර්ෂවලදීද විගණන විමසුම් මගින් නිරන්තර එම කරුණු පිළිබඳව විමසීම් කරන බැවින්ද, 2023 කාර්ය සාධන වාර්තාව තුළ මෙම කාර්යාලය වෙත එම වර්ෂය තුළ ඉදිරිපත් වූ ඉල්ලීම් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස තත්‍ය නිමවුම දක්වා ඇත. එහිදී එම තීරු ශීර්ෂය සඳහා රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 මගින් ඉදිරිපත් කර ඇති ආකෘතියෙහි තීරු ශීර්ෂය ඒ ආකාරයෙන්ම යොදා ඇත. | තත්‍ය නිමැවුම් ප්‍රතිශතය දැක්විය යුතු වීම. |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාව සතු පිරිවැය රු.2,850,000 ක්වූ වාහනයක් 2020 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2024 මාර්තු 27 දින දක්වා ධාවනයෙන් තොරව පැවතුනි. | මෙම වාහනය අපහරණය සඳහා පුවත්පත් දැන්වීමක් මඟින් මිල ගණන් කැඳවූ අතර ඉදිරිපත් කර තිබූ මිල ගණන් අනුව උපරිම මිල ඉදිරිපත් කර තිබූ ගැනුම්කරු වෙත එම නියමිත මුදල ගෙවා වාහනය ලබා ගැනීමට කටයුතු කරන ලෙස 2024.04.04 දින දැනුම් දී ඇත. | ධාවනයෙන් තොරව පවතින වාහනය සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කළ යුතු වීම. |

## 3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විනය පරීක්ෂණයක් සඳහා පත් කර තිබුණු පරීක්ෂණ නිලධාරියකු විසින් පරීක්ෂණ සැසි 03 ක් පවත්වා පරීක්ෂණ කටයුතු වලින් ඉවත්වී තිබුණු අතර පසුව නව විනය පරීක්ෂණ නිලධාරියකු පත් කර විනය පරීක්ෂණ කටයුතු මුල සිට ආරම්භ කර තිබියදී සිදු කළ විනය පරීක්ෂණ සැසිවාර 03 වෙනුවෙන් පෙර පරීක්ෂණ නිලධාරියාට කොමිෂන් සභාව විසින් රු.20,252 ක් ගෙවා තිබුණි. | පරීක්ෂණ නිලධාරියා විසින් පරීක්ෂණ කටයුතු සිදු කළ සැසි 03 හි වාර්තා අධ්‍යයනය කිරීමෙන් පසු රා.ප.ච. 18/2018 හි සඳහන් පරිදි අදාළ පරීක්ෂණ ගාස්තු හා ගමන් වියදම් ලෙස රු.20,252.00 ක් ගෙවීම් කර ඇත.විනය පරීක්ෂණ කටයුතු වලින් ඉවත් වූ නිලධාරියා ඉදිරිපත් කරන ලද පරීක්ෂණ වාර්තා අධ්‍යයනය කිරීමෙන් පසුව අධ්‍යාපන සේවා කමිටුව විසින් මෙම පරීක්ෂණය මුල සිට ආරම්භ කළ යුතු බවට නියෝග ලබා දී ඇත. ඒ අනුව වන පරීක්ෂණ නිලධාරියා විසින් පරීක්ෂණය මුල සිට ආරම්භ කර කටයුතු කරගෙන ගොස් මේ වන විට පරීක්ෂණය අවසන් කර ඇත. | නව විනය පරීක්ෂණ නිලධාරියකු පත් කර විනය පරීක්ෂණ කටයුතු මුල සිට ආරම්භ කලේ නම් සිදු කළ විනය පරීක්ෂණ සැසිවාර 03 සඳහා ගෙවීම් කිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගැනීමට සැලසුම් කරන එක් එක් ප්‍රසම්පාදන අයිතම් වර්ගය ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණු අතර අයවැය ඇස්තමේන්තුවේ එක් එක් මූලධන වැය විෂයය හා ඒ යටතේ සඳහන් අයවැයගත මුදල දක්වා තිබුණි. තවද සැලැස්මේ සේවා යටතේ සනීපාරක්ෂක සේවා හා ආරක්ෂක සේවා සඳහා ඇස්තමේන්තුගත වියදම දක්වා නොතිබුණි. | මුදල් අමාත්‍යාංශය හා අදාල දෙපාර්තමේන්තු විසින් වරින් වර නිකුත් කරන ලද චක්‍රලේඛ වලට අනුකූල පරිදි ප්‍රසම්පාදන සැලැස්ම සකසා ඇත. සනීපාරක්ෂක සේවා හා ආරක්ෂක සේවා ප්‍රසම්පාදන සැලැස්මට අනුව ක්‍රියාත්මක කර ඇති අතර, ඉදිරි වර්ෂයේදී ඇස්තමේන්තුවද ඊට ඇතුලත් කිරීමට අදාල නිලධාරින්ට උපදෙස් ලබා දී ඇත. | එක් එක් ප්‍රසම්පාදන අයිතම් වර්ගය ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කළ යුතු වීම. |
| (ඇ) | 2022 සැප්තැම්බර් 01 දින සිට 2023 අගෝස්තු 31 දක්වා වූ කාලය සඳහා විදුලි ජනක යන්ත්‍රය හා 2022 ජූලි 13 දින සිට 2023 ජූලි 14 දක්වා වූ කාලය සඳහා ගිනි ආරක්ෂණ පද්ධතිය සේවා හා නඩත්තු කිරීම සඳහා ගිවිසුම්වලට එළඹ නොතිබියදී එම විදුලි ජනක යන්ත්‍රය හා ගිනි ආරක්ෂණ පද්ධතිය සේවා හා නඩත්තු කිරීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් වෙත එකතුව රු.655,500 ක් ගෙවා තිබුණි. | ආයතනය විසින් වසර පහක කාලයක් සඳහා සේවා ගිවිසුම් ඇති කර ගැනීමට ඇස්තමේන්තු ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව වසරින් වසර අදාල පෞද්ගලික ආයතනය සමඟ සේවා ගිවිසුම් සඳහා ආයතනය එකඟතාවය පළ කර ඇත.<br><br>2022/2023 වර්ෂ සඳහා අදාළව මෙම ආයතනය මගින් ඉදිරිපත් කරන ලද මිල ගණන් අතර වෙනසක්(වැඩිවීමක්) පැවතුණි. ඒ අනුව ඔවුන් විසින් දෙවනුව මිල ගණන් අඩුකර අදාල ගිවිසුම සංශෝධනය කර ඉදිරිපත් කර ඇති බැවින් මෙවන් ප්‍රමාද වීමක් සිදු වී ඇත. | නියමිත කාලසීමාවන් තුලදී අදාල ගිවිසුම් වලට එළඹීමට කටයුතු කල යුතුවේ. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා සුදුසු විගණකවරයකු පත් කරනු ලැබිය යුතු වුවත්, 2023 ඔක්තෝබර් 03 දින සිට අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවතුනි. | මෙම කාර්යාලයේ අභ්‍යන්තර විගණන තනතුරෙහි පුරප්පාඩුව සම්පූර්ණ කරන ලෙස රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා ඇති අතර මෙතෙක් නිලධාරියෙකු පත්කර එවා නැත. | ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක කළ යුතු වීම. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂනයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 ජනවාරි 28 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරගෙන තිබූ තාක්ෂණ නිලධාරී තනතුරු දෙකක් සඳහා 2024 පෙබරවාරි 29 දින වන විටත් නිලධාරීන් පත් කර නොතිබුණි. | ගොඩනැගිල්ලේ ඇතිවන තත්ත්වයන් සම්බන්ධ තාක්ෂණික නිර්දේශ ලබා ගැනීමේ අවශ්‍යතාවය මත පදනම්ව තාක්ෂණ නිලධාරී(සිවිල්) හා තාක්ෂණ නිලධාරී(යාන්ත්‍රික) වශයෙන් තනතුරු දෙකක් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමත කර ගැනීමට කටයුතු කරන ලදී. වර්තමානයේ ගොඩනැගිල්ල නඩත්තු කටයුතු පූර්ව එකඟතාවය මත ගිවිසුම්ගත සේවාවන් මගින් ඉටු කර ගැනීමට කටයුතු කරන බැවින් තාක්ෂණ නිලධාරී(සිවිල්) තනතුර සඳහා වැඩ බැලීමේ පදනම මත නිලධාරියෙකු යෙදවීමට | අත්‍යවශ්‍ය තනතුරු වල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වීම හෝ අවශ්‍ය නොවන තනතුරු පිළිබඳ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට කටයුතු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | කටයුතු කර ඇත. මෙම කාර්යාලයේ කාර්මික නිලධාරී (යාන්ත්‍රික) තනතුර සඳහා පූර්ණ කාලීනව නිලධාරියෙකු පත් කරගැනීම දැනට අත්‍යවශ්‍ය නොවේ. | |
| (ආ) | විගණිත දිනය වූ 2024 ජනවාරි 19 දිනට කොමිෂන් සභාවේ තත්‍ය කාර්ය මණ්ඩලය 219 ක් විය. ඉන් නිලධාරීන් 84 කගේ කොමිෂන් සභාවේ සේවා කාලය වසර 05 ක්ද නිලධාරීන් 15 කගේ කොමිෂන් සභාවේ සේවා කාලය වසර 10 ක්ද ඉක්මවා තිබුණි. | මෙම කාර්යාලය ප්‍රියමනාප සේවා ස්ථානයක් නොවන බැවින් වසර පහක සේවා කාලයකට පසුව අනිවාර්ය ස්ථාන මාරුවීම් වලට යටත් නොවේ. කාර්යාලයේ පවත්නා රාජකාරි ස්වභාවය මත මෙම කාර්යාලය වෙත නිලධාරීන් ස්ථාන මාරුකර එවීමේදීද ඒ සම්බන්ධව පූර්ව එකඟතාවය ලබා ගත යුතුව ඇත. අනෙකුත් රජයේ කාර්යාල වල පවත්නා රාජකාරි ස්වභාවයට වඩා වෙනස් රාජකාරි ස්වභාවයක් මෙම කාර්යාලයේ පවත්නා අතර පුහුණුව සහ අත්දැකීම් සහිත නිලධාරීන් එකවර ස්ථාන මාරුකිරීම ආයතනයේ රාජකාරි වල ඵලදායීතාවයට හා කාර්යක්ෂමතාවයට සෘජු බලපෑම් එල්ල කරන බැවින් සේවා කාලය වසර පහක් ඉක්මවූ පමණින්ම ඔවුන් ස්ථාන මාරු කිරීමේ හැකියාවක් නොමැත. | ස්ථාන මාරු ප්‍රතිපත්තියට අනුකූල විය යුතු වීම. |